කොළඹ විශ්ව විද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය
05 වන බී.ඒ.එම්.එස් වාර්ෂික පරීක්ෂණය - 2016 ජනවාරි

## ස්ත්‍රී රෝග

කාලය - පැය 03
ප.ව. 1.00- ප.ව 4.00

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
පිළිතුරු ලිවීමේ දී සෑම කොටසක් සඳහාම වෙන වෙනම පිළිතුරු ලිවීමේ පොතක් භාවිත කරන්න.

## I කොටස

01. i. ආර්තව චක්‍රය පිළිබඳ ආයුර්වේද විග්‍රහය දක්වන්න. (ලකුණු 08)

ii. අවුරුදු 48ක් වයස කාන්තාවක් මාස 03 ක සිට පවතින ආර්තව චක්‍රයේ අක්‍රමිකතාවයක් සහ අතුල් පතුල්වල පවතින දැවිල්ල ස්වභාවයක් පිළිබඳව පැමිණිලි කරයි. ඇය ගේ මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඔබ ගේ රෝග විනිශ්චය දක්වා ඒ අනුව ඇයට ඇතිවිය හැකි රෝග ලක්ෂණ හා ඇයට දිය හැකි ප්‍රතිකාර දක්වන්න. (ලකුණු 12)

02. i. යෝනි ව්‍යාපත් සඳහා නිසි ප්‍රතිකාර නොකිරීමෙන් ඇතිවිය හැකි උපද්‍රව මොනවාද? (ලකුණු 04)

ii. වැඩිපුර රුධිර වහනයක් විය හැකි යෝනි ව්‍යාපත් නම් කර ඒවා වෙන්කර හඳුනාගැනීමට උපයෝගිවන ලක්ෂණ දක්වන්න. (ලකුණු 06)

iii. යෝනිය මගින් අධික රුධිරය වහනයක් සිදුවන අවස්ථාවක දී සිදුකළ යුතු චිකිත්සා පද්ධතියක් සඳහන් කරන්න. (ලකුණු 10)

03. වයස අවුරුදු 28ක් වන කාන්තාවක් ආර්තවයේ දී පිට වන රුධිර ප්‍රමාණය අඩු බවත් වේදනාවක් පවතින බවත් පැමිණිලි කරයි.

i. විවිධ රෝග විනිර්ණය හා රෝග විනිශ්චයට එළඹෙන ඇයුරු දක්වන්න. (ලකුණු 06)

ii. ඔබ ගේ රෝග විනිශ්චයට අදාළව ඇයට නිර්දේශ කරනු ලබන කෂාය 2 ක් වට්ටෝරු කරන්න. (ලකුණු 08)

iii. ආර්තව ව්‍යාපත් ලෙස ආයුර්වේදයේ දැක්වෙන රෝග වර්ගීකරණය කුමක් ද? (ලකුණු 06)

අනික් පිටුව බලන්න.

04. i.ආයුර්වේදයේ සඳහන් අර්බුධ ප්‍රභේද දක්වන්න. (ලකුණු 04)

ii.බහුලව දක්නට ලැබෙන කාන්තා රෝගයක් වන ගර්භාශගත ෆයිබ්‍රොයිඩ් තත්වය ආයුර්වේදීයව හඳුන්වන්න. (ලකුණු 06)

iii. එම රෝගයට දිය හැකි ඖෂධ හා බාහිර ප්‍රතිකාර දක්වන්න. (ලකුණු 10)

05. කෙටි සටහන් ලියන්න.

i. ස්තන විද්‍රධි

ii. යෝනි කන්ද

iii. සුදයාම

iv. රතී රෝග (ලකුණු 5x4 =20)

**04.01.2016**